රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 18/2006

මගේ අංකය – 76/1/29/21/MCC/vi
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2006 ඔක්තෝබර් මස 09 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්.

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන නිබන්ධනය ඉදිරිපත් කිරීම.**

විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාවේ 19 (ආ) ඡේදය යටතේ වන නිබන්ධනය ඉදිරිපත් කිරීමට අවශ්‍ය පහසුකම් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් සලසා ඇති බව මේ මගින් දැනුම් දෙමි.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සම්බන්ධයෙන් දැනට ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 19 (ආ) වගන්තියේ මෙසේ සඳහන් වේ.

19 (ආ) "ලේකම්ගේ උපදෙස් අනුව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂවරයා සහ කලින් එකඟ වූ පරිදි රාජ්‍ය පරිපාලනය, කළමනාකරණය, රාජ්‍ය ප්‍රතිපත්ති, ආර්ථික විද්‍යාව සහ සමාජ සංවර්ධනය යන විෂය ක්ෂේත්‍රයන්ට අදාලව ලිඛිත නිබන්ධනයක් ඉදිරිපත් කලයුතුය. ඒ අනුව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ විසින් පත් කරනු ලබන තීරක මණ්ඩලයක් ඉදිරියේ අදාල නිලධාරියා එකී නිබන්ධනය ඉදිරිපත් කලයුතුය."

මෙම නිබන්ධනය ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන නිලධාරීන් පහත සඳහන් පරිදි කටයුතු කලයුතුය.

I. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත තමන් අධ්‍යයනය කිරීමට බලාපොරොත්තුවන විෂය ක්ෂේත්‍රය පිළිබඳ නිබන්ධන යෝජනාවක් ඉදිරිපත් කලයුතුය. මෙම නිබන්ධන යෝජනාව තුළ තමන් අධ්‍යයනය කිරීමට බලාපොරොත්තුවන ගැටළුව පිළිබඳව ලුහුඬු හැඳින්වීමක්, කරුණු ලබාගැනීම හා විශ්ලේෂණය කිරීම සඳහා උපයෝගී කරන ක්‍රමවේදය හා නිබන්ධන ආකෘතිය යන විස්තර ඇතුලත් විය යුතුය. ඔබ විසින් අධ්‍යයනය කිරීමට තෝරාගනු ලබන ගැටළුව අදාල ක්ෂේත්‍රය තුල ප්‍රතිපත්තිමය වශයෙන් වැදගත් වන ගැටළුවක් විය යුතුය.

II. ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුමත කළ බව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් දැනුම් දීමෙන් පසු එම අධ්‍යයන කටයුතු නිම කොට නිබන්ධනය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත ඉදිරිපත් කලයුතුය. අවශ්‍ය වන්නේනම් මේ සඳහා අධීක්ෂක වරයෙකුගේ මග පෙන්වීම යටතේ නිම කිරීමට කටයුතු කළ හැකිය.

III. ඔබගේ නිබන්ධනය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් පත් කරනු ලබන තීරක මණ්ඩලයක් ඉදිරියේ ඉදිරිපත් කලයුතු අතර ඔවුන් විසින් එය ඇගයීමට ලක්කර එහි ප්‍රතිඵල ඔබ වෙත දන්වනු ඇත.

ඩී. දිසානායක
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.